# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
# බෞද්ධාලෝක වෙසක් රජත ජයන්තිය- ශ්‍රී බු.ව. 2570/2026
## <u>වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනය</u>

**<u>නිර්මාණයේ විස්තර</u>**

1. නිර්මාණයේ උස :----------------------- වට ප්‍රමාණය/ පළල (ගැඹුර) -------------------------දිග -- ----------------

2. අවශ්‍ය කුඩාරමේ මැද උස :-------------- දිග :-------------------- පළල :----------------

3. ප්‍රදර්ශන භූමිය තුළ නිර්මානය සවි කිරීමට පැමිණෙන දිනය හා වේලාව - ----------------------------------------

4. ඔබට අවශ්‍ය විදුලි ප්‍රමාණය - ඇම්පියර් -------------------- (සිංගල් ෆ්‍රේස් /ත්‍රී ෆ්‍රේස්-)--------------------------------

5. විදුලි මෝටර් භාවිතය/ විදුලි බුබුළු භාවිතය --------------------------------------------------------------------------
-

6. භාවිතා කරන අමුද්‍රව්‍ය -------------------------------------------------------------------------

**<u>අයදුම්කරුගේ විස්තර</u>**

1. අයදුම්කරුගේ මුල් අකුරු සමඟ නම :-----------------------------------------------------------------------------
-

2. ලිපිනය :-----------------------------------------------------------------------------------------------------

3. ස්ත්‍රී/පුරුෂ භාවය :- ---------------------------------------------------------------------------------------------
-

4. දුරකථන අංකය : (නිවස) --------------------------(ජංගම)---------------------Whatsapp අංකය ------------------

5. ජාතික හැඳුනුම්පත් අංකය :- ------------------------------ (ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් අනිවාර්ය වේ.)

දිනය ----------------------                              ----------------------------------------------
                                                        අයදුම්කරුගේ අත්සන

**සැලකිය යුතුයි :-1.** **ඔබගේ නිර්මාණය වෙසක් තෙමගුලට උචිත වන ආකාරයෙන් නිර්මාණය කළයුතු අතර, සම්මේලනය විසින් කුටියක්,විදුලි සම්බන්ධතාවය සහ ආහාර ලබා දෙනු ඇත.**

**2.** **අයදුම් පත්‍රය සමග නිර්මාණයේ දළ රූප සටහනක් අමුණා එවන්න.**

# බෞද්ධාලෝක වෙසක් රජත ජයන්තිය- ශ්‍රී බු.ව. 2570/2026
## වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනය

### ඇගයීමේ පදනම මත වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනයට ඉදිරිපත් වන්නන් සඳහා වන උපදෙස්, තොරතුරු සහ නීතිරීති

1. ඔබගේ නිර්මාණය අර්ථාන්විත වෙසක් පහන් කූඩුවක් විය යුතු අතරම, එහි අවමය දිගින් සහ පළලින් අඩි තුන (03) ක් ද, අවම උස අඩි හතර (04) කට ද නොඅඩු වූ නිර්මාණයක් විය යුතුය.

   බෞද්ධාලෝක වෙසක් කමිටුව මගින් ප්‍රදර්ශන භූමිය තුළ කුඩාරම් ලබා දීමේදී උපරිම මැද උස අඩි හත (07') හෝ අඩි දහතුන (13') හෝ අඩි දහඅට (18') ලෙස ලබා ගත හැකි අතර, එහි වට ප්‍රමාණය අඩි අට (08') ක් නොඉක්ම විය යුතු ලෙස නිර්මාණය කර තිබිය යුතුය.

   නමුත් නිර්මාණයේ ස්වභාවය අනුව කලින් ඉල්ලුම් කර වෙසක් කමිටුවෙන් ලබා ගත් විශේෂ අවසරයක් මත පමණක් මෙම උස, පළල හෝ දිග වට ප්‍රමාණයන් වැඩි කර කුඩාරම සකස් කරවා ගත හැක. (අවශ්‍ය කුඩාරම් ප්‍රමාණය මැයි මස 15 වැනි දින වන විට සම්මේලනයට ලිඛිතව දැනුවත් කළයුතුය.)

   මීට පෙර බෞද්ධාලෝක  වෙසක් කලාපයෙහි තරඟ අවස්ථාවන් සඳහා ඉදිරිපත් කළ වෙසක් පහන් කූඩු ඉදිරිපත් නොකරන ලෙස දන්වා සිටිමු.

2. පොලිතින්, රිජිපෝම්, ප්ලාස්ටික් වැනි පරිසර දූෂක ද්‍රව්‍ය හැර කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය යොදා ගැනීමේ හැකියාව ඇත. මෙය විවෘත ප්‍රදර්ශනයක් ලෙස සංවිධානය කොට විනිශ්චය කටයුතු සිදු කරනු ඇත.

   විනිශ්චය කටයුතු සිදු කිරීමේදී නිර්මාණයේ ආලෝකකරණය, සංකල්පය හා තාක්ෂණය, නිර්මාණකරණය හා එහි ගුණාත්මකභාවය, නිමාව හා ඉදිරිපත් කිරීම මෙන්ම පසුතලය සකස් වන ආකාරය පිළිබඳව හා වෙනත් විශේෂතා පිළිබඳව ද සැළකිල්ලට ගනු ඇත.

   ඔබගේ නිර්මාණය අර්ථාන්විත වෙසක් පහන් කූඩුවක් විය යුතු අතර අයදුම් පත සමඟ වෙසක් පහන් කූඩුවේ ස්වභාවය උස හා පළල ඉතා හොඳින් නිරූපනය වන පරිදි රූප සටහනක් සමඟ පහන් කූඩුව පිළිබඳ විස්තරයක් ලබා දීම අනිවාර්ය වන අතර, එම සැළැස්මේ රහස්‍යභාවය රැකීමට කමිටුව වගබලා ගනු ඇත. එම විස්තර තුළ නිර්මාණයේ උපරිම උස සහ පළල සඳහන් කර තිබීමත්, එම රූප සටහනට අනුකූලව නිර්මාණය ඉදිරිපත් කිරීමේ වගකීම ද නිර්මාණකරුගේ යුතුකම වෙයි.

3. නිර්මාණය මෙන්ම නිර්මාණය ප්‍රදර්ශනය කරන කුටිය ද වෙසක් තේමාව හෝ බෞද්ධ තේමාවකට අනුගත වන අයුරින් සහ නිර්මාණයට සුදුසු පරිදි අලංකාරව තැබීම පිළිබඳව ද තරඟකරු සැළකිලිමත් විය යුතුය. මෙය තරඟ විනිශ්චයේදී සලකා බලනු ඇත.

4. බෞද්ධාලෝක වෙසක් කමිටුව ලබා දෙන කුටිය තුළදී ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය විදුලි බුබුළු සහ උපාංග සියල්ල තමා විසින් සපයා ගත යුතු අතර, ඒවායේ ආරක්ෂාව පිළිබඳව ද වගබලා ගැනීම තරඟකරුගේ වගකීමක් ලෙස සැළකේ.

   ඔබට අවශ්‍ය විදුලි බලය පිළිබඳව දින 10 කට පෙර අප හට දැනුම් දිය යුතු අතර, එය අයදුම්පතෙහිද සඳහන් කල යුතුය. එසේම භාවිතා කරන විදුලි බුබුළු විස්තර සහ විදුලි මෝටර් පිළිබඳ දැනුවත් කළයුතුය. (ඔබ හැකිතාක් විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කළහැකි විදුලි බුබුළු සහ විදුලි මෝටර් පමණක් භාවිතා කිරීමට උනන්දු වන්න.)

   ප්‍රදර්ශන කාලය තුළ කුටියක උපරිම වශයෙන් දෙදෙනෙකුට රැඳී සිටීමට අවසර ලැබෙන අතර, ඉටි පන්දම් හෝ පොල්තෙල් පහන් දැල්වීමට අවසර දෙනු නොලැබේ. තම පහන් කූඩු නිර්මාණය සඳහා විදුලි සැපයුම ප්‍රදර්ශන කාල සීමාව තුළදී පමණක් අප විසින් ලබා දෙනු ලබන අතරම, නිර්මාණයේ විදුලි තත් ඇදීම ඉතා නිවැරදිව සිදු කර ඇති බවට තරඟකරු වග බලා ගත යුතුය.

   වෙසක් පහන් කූඩු ප්‍රදර්ශන කුටියේ සිටින ඔබ හේ ඔබේ  සහායකයන් ප්‍රදර්ශන අවස්ථාවන්හි වෙසක් උළෙලට උචිත සුදු ඇඳුමකින් සැරසී සිටීමට ද, හැසිරීමට ද ආචාරශීලි විය යුතුය. ප්‍රදර්ශන පැවැත්වෙන මුළු කාල සීමාව තුළදී තම නිර්මාණය ප්‍රදර්ශනය විය යුතුය.

   එම කාල සීමාව තුළදී දෙදෙනෙකු සඳහා ආහාර සහ පහසුකම් ලබා දීමට බෞද්ධාලෝක වෙසක් කමිටුව කටයුතු යොදා ඇත. එම අවසරපත් ප්‍රදර්ශන කටයුතු ආරම්භයට පෙර කාර්යාලයෙන් ලබා ගැනිමට කටයුතු කිරීම තරඟකරුවාගේ වගකීමයි.

   තම නිර්මාණය සමඟ රැඳී සිටින සහායකයා පිළිබඳව විස්තර කල්වේලා ඇතිව කාර්යාලයට ලබා දීම තරඟකරුගේ යුතුකමක් වේ.

5. විනිශ්චය මණ්ඩලයේ ඇගයීමට ලක්වන සියලුම නිර්මාණ සඳහා මුදල් ත්‍යාග හා සහතික පත්‍ර හිමි වේ.
   බෞද්ධාලෝක වෙසක් කමිටුවේ සහ නිර්මාණයන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සියලුම නිර්මාණකරුවන් පිළිගත යුතු අතර තරඟ කොන්දේසි මතම ඔබගේ සහභාගීත්වය සිදු විය යුතුය.

6. බෞද්ධාලෝක වෙසක් කමිටුවේ සහ විනිශ්චය මණ්ඩලයේ නිර්දේශවලට හා ප්‍රමිතීන්ට අනුකූල නොවන සියලුම නිර්මාණ සඳහා ත්‍යාග සහ ප්‍රසාද ගෙවීම් කිසිවක් ලබා ගැනීමට සුදුසුකම් නොලබන අතර, පහත දක්වා ඇති මුදල් ත්‍යාගයන් සහ ස්ථාන ගණන වෙනස් කරලීම සම්මේලනය සතු වන බව සියලුම නිර්මාණකරුවන් පිළි ගත යුතුය.

7. **තම නිර්මාණය 2026 මැයි මස 30 වන වෙසක් පෝය දින සවස සිට මැයි මස 31 සහ ජුනි 01 වෙනි දිනයන් දක්වා සෑම දිනකම සවස 7.00 සිට පසුදා අළුයම 3.00 දක්වා සම්පූර්ණ ප්‍රදර්ශනය සඳහා තැබීම අනිවාර්ය වේ. මැයි මස 29 දින වන විට ඔබට හිමි ස්ථානය අප කාර්යාලයට පැමිණ වෙන් කර ලියාපදිංචිය තහවුරු කර ගත යුතු අතර, සියලුම පහන් කූඩු නිර්මාණ මැයි මස 30 දින මධ්‍යහන 12 වන විට තමන්ට අයත් ස්ථානය වෙත පැමිණ විදුලිය ලබා ගැනීමේ කටයුතු සිදු කර ගතයුතුය. මෙය ඔබගේත් අපගේත් පහසුව උදෙසා වනු ඇත. (ඉන්පසු වෙසක් පහන් කූඩු භාරනොගන්නා බවද දන්වා සිටිනු කැමැත්තෙමු.)**

8. වෙසක් පහන් කූඩු විනිශ්චය ම සිදුවන මැයි 30 සහ 31 දෙදින තුල රාත්‍රී 08.00 සිට මධ්‍යම රාත්‍රිය දක්වා වශයෙන් සිදු කරන අතර එහි කූඩුව හිමි තැනැත්තා කුටිය තුල රැඳී සිටීම අනිවාර්ය වේ.

9. **සියලුම ප්‍රදර්ශනකරුවන්ගේ නිර්මාණයන් විනිශ්චය කර බෞද්ධාලෝක වෙසක් කමිටුවේ නිර්දේශ මත ත්‍යාග පිරිනමනු ඇත.** (ත්‍යාග මුදල් ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ)

**සැයු - ප්‍රදර්ශනය අවසන් වන දින රාත්‍රියේ 8.00 ට ප්‍රදර්ශන කලාපය තුළ විශේෂ වේදිකාවක් මත ජයග්‍රහණයට ලක්වන නිර්මාණකරුවන් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කෙරේ. තවද ප්‍රධාන උත්සවය සඳහා ඔබ සහභාගී විය යුත්තේ සුදු ඇඳුමකින් බව සිහිපත් කර සිටිමු.**

**අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය - 2026 මැයි මස 15 වැනි දින වේ.**

**අයදුම්පත් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන කාර්යාලය වෙතින් හෝ** www.acbc.lk/application/ **වෙබ් අඩවියට යොමු වීමෙන් ලබා ගත හැක.**

<u>**විමසීම්**</u> - ගරු සමලේකම් සහ ප්‍රධාන සම සංවිධායක තුෂාර දිලුම් වාහලතන්ත්‍රි මහතා - 077-3113805

**සභාපති - බෞද්ධාලෝක වෙසක් කමිටුව**
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය,**
**380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**
**දු.අංක - 011-2691695/ 2688517**
**විද්‍යුත් තැපෑල :** acbc380@gmail.com
**වෙබ් අඩවිය -** www.acbc.lk
**ජංගම දුරකතන අංකය :- 076-5611374**
Whatsapp **අංකය - 076-5611374**